www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දේශපාලන අර්බුදයේ සලකුනක්: ශ්‍රී ලංකාවේ පක්ෂවල හවුල ගොඩනගයි

## A sign of political crisis: coalition of Sri Lankan parties formed

**කේ රත්නායක විසිනි**
**2006 නොවැම්බර් 03**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්ථාපිත පක්ෂ දෙක වන පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂයත් (එජාප) ඉතිහාසයේ ප්‍රථම වතාවට පසු ගිය සතියේ විධිමත් හවුල් ගිවිසුමකට අත්සන් තැබී ය. මහා සන්ධානය ව්‍යාපාරික නායකයන් හා මාධ්‍ය විසින් හුවාදක්වා ඇත්තේ "ජයග්‍රහන අත් කර ගන්නා වකවානුවක්" ලෙස ය. යථාර්ථයේ දී එය, රටේ ගැඹුරුවන දේශපාලන අර්බුදයේ සලකුනකි.

අඩ සියවසකටත් වැඩි කලක් බලය සඳහා කටුක එදිරිවාදීන්ව සිටි ශ්‍රීලනිපය සහ එජාපය, ජාතික ඒකාබද්ධතා ආන්ඩුවක් පිහිටුවීමට මීට පෙර කල සියලු ඉල්ලීම් නොතකා හැර තිබේ. රටේ ඇවිලෙමින් තිබෙන සිවිල් යුද්ධය කෙසේ හෝ අවසන් කර විදේශ ආයෝජන නංවන වෙලඳපොල ප්‍රතිසංස්කරනයේ න්‍යාය පත්‍රයක් සහිතව ඉදිරියට යෑම සඳහා කොන්දේසි මේ මගින් සම්පාදනය කරනු ඇතැයි පාලක කවයන් මංමුලාසහගතව බලාපොරොත්තු වේ.

ශ්‍රීලනිපයේ ප්‍රධාන ලේකම් මෛත්‍රීපාල සිරිසේන හා එජාපයේ සභාපති මලික් සමරවික්‍රම, ජනාධිපති නිල නිවස වන අරලියගහ මන්දිරයේ දී අවබෝධතා ගිවිසුමට (එම්ඕයූ) ඔක්තෝබර් 23 දින අත්සන් තැබූහ. වසර දෙකක ගිවිසුම යටතේ එජාපය, "උතුරු නැගෙනහිර ගැටුම්" මැතිවරන සංශෝධන, "යහපාලනය" හා සමාජ සංවර්ධනය යන ප්‍රධාන කරුනු හතර විසඳීම සඳහා ආන්ඩුවට සහාය දෙන බවට එකඟ විය.

"එක්ව කටයුතු කිරීමේ ව්‍යුහය, රාජපක්ෂ හා එජාප නායක රනිල් වික්‍රමසිංහ අතර තවමත් තීරනය වී නැත. අපකීර්තිමත් ප්‍රතිපත්ති තුලින් ජනිත කරනු ලබන නොවැලැක්වියහැකි විරුද්ධත්වයට මුහුනපෑමට පක්ෂයට සිදුවන බව හොඳින් දන්නා වික්‍රමසිංහ ද ඇතුලු එජාප නායකත්වයේ කොටසක්, කැබිනට් තනතුරු බාරගැනීමට දැඩි මැලිකමක් දක්වති.

මෙම අදියරේ දී වික්‍රමසිංහ යෝජනා කර ඇත්තේ, එජාපය විපක්ෂ අසුන්වල රැඳී සිටින බවයි.

පරදුවට තැබී ඇත්තේ කුමක් ද යන්න පිලිබඳව දෙපක්ෂයේ ම නායකයන් සාවධානව සිටිති. අත්සන් තැබීමේ උත්සවයේ දී රාජපක්ෂ අනතුරු ඇඟවූයේ "දේශපාලන පක්ෂ අතර වෙනස්කම් හේතු කොට ගෙන මෙම ජාතිය ප්‍රපාතයේ නොහෙලිය යුතුය" යනුවෙනි. වික්‍රමසිංහ පසුව මාධ්‍ය හමුවකට පැවසූවේ "ජනතාව පීඩාවට පත් කරන අර්බුදයේ කාලයකදී විරුද්ධ පක්ෂයත් ආන්ඩුවත් එක්ව කටයුතු කරයි. විරුද්ධ පක්ෂය ආන්ඩුවට සහාය දීම ඉතා කලාතුරකින් සිදු වන්නකි. අප රටේ ඉතිහාසයේ මෙම තීරනාත්මක සන්ධිස්ථානයට අප පැමින සිටිමු." යනුවෙනි.

අර්බුදයේ හරි මැද ඇත්තේ යලි ඇවිලුනු සිවිල් යුද්ධයයි. ජාතික හෙල උරුමය (ජාහෙඋ) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන සිංහල අන්තවාදී පක්ෂ දෙක සමග මැතිවරන ගිවිසුම් අත්සන් තැබීම මගින් පසු ගිය නොවැම්බර් ජනාධිපතිවරනයේ දී, වික්‍රමසිංහ පරදවා රාජපක්ෂ යාන්තමින් ජය ගත්තේ ය. ජයග්‍රහනයෙන් පසු දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව, ඝාතන හා ප්‍රකෝපකාරිත්වයේ සැඟවුනු යුද්ධය උග්‍ර කිරීමට මිලිටරිය පියවර ගත්තේ ය.

එජාපය සමග එකඟතාවයට ඒමට පෙර ශ්‍රීලනිපය, හවුලක් සඳහා ජවිපෙ සමග සාකච්ඡා පැවැත්වී ය. කෙසේ වුවද එල්ටීටීඊයට එරෙහිව වඩාත් ආක්‍රමනශීලී යුද්ධයක් ගෙනයාමටත්, ආන්ඩුව 2002 සටන් විරාමය ඉරා දැමිය යුතු බවටත් ජවිපෙ බලකිරීම් හමුවේ සාකච්ඡාවන් බිඳ වැටුනි. විවෘත යුද ප්‍රකාශයකින්, ආන්ඩුවට බරපතල දේශපාලන ගැටලු නිර්මානය වනු ඇති බව රාජපක්ෂ හොඳින් දැන සිටියි. ජාත්‍යන්තර පිටුබලය රඳවාගැනීමත් රට තුල පැතිර පවතින යුද විරෝධී මනෝගතිය අවුලුවා නොගැනීමත් යන දෙකම සඳහා මිලිටරියේ ක්‍රියාන්විතයින් ආරක්ෂනවාදී ලෙස වෙස් ගැන්වීමට ඔහු උත්සාහ කරයි.

මේ අනුව ශ්‍රීලනිපය, 2002 දී සටන් විරාමයට අත්සන් තබා 2003 දී එල්ටීටීඊය සමග සාකච්ඡා පැවැත්වූ එජාපය වෙතට හැරුනි. කෙසේ වෙතත්, ශ්‍රීලනිප-

එජාප ගිවිසුම සාමය දෙසට තැබූ පියවරක් සලකුනු නොකරයි. ගිවිසුම 2002 සටන් විරාමය කරා ආපසු යෑමක් මත පදනම් නොවන නිසා මිලිටරියට තව දුරටත් නිදහසේ කටයුතු කිරීමට අවස්ථාව ලබා දී තිබේ. 1983 දී යුද්ධය ඇරඹීමට වග කිව යුතු වූ එජාපය, සිය එදිරිවාදියා සේම, සිංහල ස්වෝත්තමවාදයේ ගිලී ඇත. එය 2002 දී සාම සාකච්ඡාවලට එළඹුනේ, වැඩ කරන ජනතාව මත යුද්ධයෙන් ජනිත කල බලපෑම කෙරෙහි වූ උත්සුකයකින් නොව, ගැටුම විදේශ ආයෝජනයන්ට බාධකයක් බවට පත්ව තිබීම පිලිබඳ ව්‍යාපාරික කොටස් තුල පැවති අපේක්ෂා භංගත්වය පිලිබිඹු කරමිනි.

ඒකාබද්ධ ප්‍රතිපත්තීන් පිලිබඳ විස්තර කිසිවක් ප්‍රකාශයට පත් කර නැත ද, පක්ෂ දෙක විසින් සකස්කල සාකච්ඡා සටහන් ගනනාවක අඩංගු වූ දෑ, *සන්ඩේ ලීඩර්* පත්‍රයෙහි පල කර තිබේ. "උතුරු නැගෙනහිර ගැටුම" පිලිබඳ ලියවිල්ල සඳහන් කරන්නේ: "අවශ්‍ය වන විට මිලිටරි ක්‍රියාවලීන් ද ඇතුලත් රජය සතු සියලු මාධ්‍යයන් මගින්, රටේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමේ පරම වගකීම එය සතු වේ." ඒ සමග ම එය, යුද්ධය අවුලුවාලීමට තුඩු දුන්, රටේ දෙමල සුලුතරයට එරෙහිව වෙනස්කම් කිරීම ලෙස ද දැක්විය හැකි "ජනවාර්ගික ප්‍රශ්නයට" දේශපාලන විසඳුමක් ද කැඳවුම් කර සිටියි.

මෙවන් සූත්‍රගත කිරීම් මගින් ආන්ඩුවට, සාම දායකයන් ලෙසින් පෙනී සිටින ගමන් ම ආක්‍රමනික යුද්ධයක් ගෙන යාමට ද ඉඩ සලසා දෙයි. යුද්ධය සඳහා දේශපාලන විසඳුමක් යෝජනා කිරීම සඳහා රාජපක්ෂගේ අනුග්‍රහයෙන් පැවැත්වෙන සර්වපාක්ෂික සමුලුවට යලි සහභාගිවීමට, එජාපය එකඟ වී ඇත. ජවිපෙ නියෝජිතයන් ද ඇතුලත් වන මෙම සමුලුව, එල්ටීටීඊයට එරෙහිව මිලිටරි ප්‍රහාරයන් සඳහා වන දේශපාලන ආවරනයකට වැඩි දෙයක් නොවේ.

ශ්‍රීලනිප-එජාප ගිවිසුම අත්සන් තැබුවේ පසු ගිය සති අන්තයේ ජිනීවාහි දී පැවැත්වූ සාම කථා වටයට යන්තම් දින ගනනකටපෙර ය. මෙම ගිවිසුම කොලඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් වහාම හුවා දැක්වූයේ, රටේ ප්‍රධාන පක්ෂ දෙක, "ගැටුමට දේශපාලන විසඳුමක් සෙවීම සඳහා එක්ව වැඩ කිරීමට ගත් තීරනයක සලකුනක්" ලෙස ය. සැබැවින්ම, එජාපයේ ද පිටුබලය සහිතව ආන්ඩුව 2002 දීට වඩා දැඩි බලපෑම් එල්ටීටීඊය මතට යොදන්නේ ය. යන්න වොෂින්ටනය හොඳින්ම වටහා ගෙන සිටියි. ජිනීවා සාකච්ඡා, තවත් වටයක් සඳහා කිසිදු යෝජනාවකින් තොරවම බිඳ වැටීම, පුදුමයක් නොවේ.

සියලු බලය යොදා එල්ටීටීඊයට එරෙහිව යුද්ධ කිරීම සඳහා විවෘතව උද්ඝෝෂනයේ යෙදී සිටින ජවිපෙ දේශපාලන මන්ඩලය, නව සහාගය "එල්ටීටීඊ බෙදුම්වාදය පරාජය කිරීමේ සීමිත පියවර පවා දියාරු කරන" එජාප උගුලක් ලෙස හෙලා දක තිබේ. ආන්ඩු විරෝධී අතෘප්තිය ගසාකෑමේ අරමුනෙන් ජවිපෙය, කොලඹ ද ඇතුලුව දිස්ත්‍රික්ක ගනනාවක රැස්වීම් සංවිධානය කිරීමට සැලසුම් කරයි. "ඔහු (රාජපක්ෂ) නිවැරදි මගට පිවිසෙන්නේ නැති නම්, ඔහුගේ ඔටුන්න ගලවා ඒ වෙනුවට වෙන අයෙකු ආදේශ කිරීමට අපට සිදු වනු ඇතැයි" බදාදා පැවති රැලියක දී ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා අනතුරු ඇඟවී ය.

ජවිපෙ උද්ඝෝෂනය වනාහි, මීට පෙර 2004 වසරේදී ශ්‍රීලනිප සහාග ආන්ඩුවට ඇතුල්වීමෙන් පසුව ඔවුන් දුන් පොරොන්දු ඉටු කිරීමට අසමත් වීම නිසා හටගත්, පුලුල්ව පැතිරීගිය කලකිරීම මගහරවා ගෙන සහයෝගය යලි ගොඩ නැගීමට දරන හුදෙක් මංමුලා සහගත උත්සාහයකි. වැඩ කරන ජනතාවගෙන් බහුතරයක් ආන්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිවල සමාජ ප්‍රතිවිපාක කෙරෙහි ගැඹුරින්ම සතුරු වන අතර, යුද්ධය සඳහා ද ජනතා සහයෝගයක් නැත. ජවිපෙ සිය ප්‍රහාරය එජාපය කෙරෙහි යොමු කර ඇත්තේ, 2002ත් 2004 අතර කාලයෙහි එය විසින් ක්‍රියාත්මක කල කඩිනම් වෙලඳපොල ප්‍රතිසංස්කරන කෙරෙහි පුලුල්ව පැතිර තිබූ වෛරය පිලිබඳව හොඳින්ම දැන සිටිමිනි.

## ආර්ථික පිලිවෙත්

ආර්ථික හා සමාජ ප්‍රතිපත්තීන් පිලිබඳ ශ්‍රීලනිප හා එජාප සාකච්ඡා සටහන්වල, දුප්පතුන් හා පොහොසතුන් අතර ආගාධය නොවරදවා ම පුලුල් කරන කප්පාදුවේ පියවර මාලාවක් පහත සඳහන් දේ ද සමග ඇතුලත් වේ.

* "ජාතික සෞඛ්‍ය අරමුදලක් යෝජනා කර තිබේ. එයට අරමුදල් ව්‍යාපාර බදු ද සමග "පුරවැසියන්" ගෙන්සැපයේ. 1950 හා 60 ගනන්වල ඇති කරන ලද නිදහස් පොදු සෞඛ්‍යසේවාව බලයට පත් වූ ආන්ඩු විසින් ක්‍රමානුකූලව කප්පාදු කර ඇත. වර්තමානයේ ඇති පන්ති දෙකේ සෞඛ්‍ය සේවය එනම්, ධනවතුන් සඳහා ව්‍යාප්තවන පෞද්ගලික අංශයක් ද, ජනගහනයෙන් බහුතරයක් සඳහා පිරිහෙන පොදු සේවාවක් ද

* දුගීන් සඳහා වූ සීමිත සුභසාධන සහන දූන්, " සමාජ වෙලඳපොල මූලාශ්‍රයන්ට ද" හිමි වේ. මෙම ක්‍රමය යටතේ, ඉක්මනින්ම සහනාධාරවලට "ඉලක්ක කරනු" ඇත. එනම් සමාජයේ දුප්පත්ම ස්තරයන්ට පමනක් එය සීමාවනු ඇත. මෙම ප්‍රතිපත්තිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශකරන පුලුල් සහනාධාර, සහන සලසන්නේ පොහොසතුන්ට පමනි යන්නට අනුකූලවේ. නිසැකයෙන්ම ධනවතුන්ට මෙයින් වාසි සැලසෙන අතර, ජාමූඅ ප්‍රතිපත්තිවල අරමුන දුගීන්ට උදව් කිරීම නොව සමස්ත සමාජ වියදම් කපා හැරීම යි.

* ගමනාගමනය ද පනිවිඩහුවමාරුව ද ඇතුලත් රාජ්‍ය අංශය තව දුරටත් ප්‍රතිසංස්කරනයට ද පුද්ගලිකරනයට ද ලක් කල යුතු ය. "සමාජයේ සැම පුද්ගලයෙකුම මෙම ව්‍යවසායන්ගේ කොටස් හිමියෙකු බවට පත් වන කොටස්හිමි සමාජ සංකල්පය " ආන්ඩුව විසින් ප්‍රචාරය කල යුතු ය. මේවායේ ප්‍රතිලාභීන් වනු ඇත්තේ පුද්ගලීකරනය කල ව්‍යවසායන්හි කොටස් මිලට ගැනීමට මුදල් ඇති අයයි. ජනතාවගේ බහුතරයක් අත්‍යාවශ්‍ය සේවාවන්හි මිල ඉහලයෑමේ තත්වයකට මුහුන දෙනු ඇත.

* කෘෂිකාර්මික ක්ෂේත්‍රයතුල දී විශේෂයෙන් ම අපනයනයන් දිරිගන්වන "වෙලඳපොල සඳහා වගාකිරීමේ" ක්‍රමයක් යෝජිත ය. මෙහි ප්‍රතිලාභ නෙලාගනු ඇත්තේ ජාත්‍යන්තර වෙලඳපොල සඳහා වගා කිරීමේ හැකියාව හා පහසුකම් ඇති ගොවීන් ද කෘෂිකාර්මික ව්‍යාපාරිකයන් ද වේ. ලංකාවේ ගොවීන්ගෙන් අතිමහත් බහුතරයට ප්‍රාග්ධනය මෙන්ම ඉඩම් ද නොමැතිවාක් මෙන් ම ඔවුන් මූලික භෝග වගාවෙන් වඩාත් ලාභදායී අපනයනයන් වෙත මාරු වීමේ දැනුමෙන් ද තොර ය.

කොලඹ කොටස් වෙලඳපොලේ තියුනු ඉහල නැගීමත් සමගින් ශ්‍රීලනිප-එජාප නව සන්ධානයයේ ආරංචිය කෙරෙහි මහා ව්‍යාපාරිකයන්ගේ උද්යෝගිමත් ප්‍රතිචාරය පලවිය. කර්මාන්ත හා වානිජමන්ඩල සම්මේලනයේ සභාපති නවාස් රාජාබ්ඩීන්, ව්‍යාපාරික පැලැන්තියේ බලාපොරොත්තු මෙසේ ගෙනහැර දැක්වී ය. "ප්‍රධාන පක්ෂ අතර බල අරගලය ද විසංවාදී දේශපාලනය දමගින් බලයට පත් වූ නායකයන් ට අපකීර්තිමත් වූවන් තීරනාත්මක ප්‍රතිසංස්කරන නොතකා හැරීමට බල කෙරිනි. ඔවුන් හුදෙක් කෙටිකාලීන ප්‍රතිඵල සහිත ජනතාවාදී දේශපාලනයක සරන පැතුහ."

ශ්‍රීලනිප-එජාප සභාගය පිහිටුවීම ලංකාවේ දේශපාලනයේ සන්ධිස්ථානයක් සලකුනු කරයි. සංස්තිතික එජාපය සැමවිටම ව්‍යාපාරිකයේ අවශ්‍යතාවන් ගේ නිර්ලජ්ජිත උපදේශකයෙක් ලෙස පෙනීසිටි අතර ශ්‍රීලනිපය, අතීතයේ දී විශේෂයෙන්ම රටේ ගම්බද සිංහලයන් වෙත ජනතාවාදී ආයාචනයන් කිරීමේ යෙදී සිටියහ.

ශ්‍රීලනිපය 1950 ගනන්වල ප්‍රමුඛත්වයට පැමිනියේ සිංහල වර්ගවාදය, සමාජවාදී නන්දෙඩවිලි හා ප්‍රතිසංස්කරනවාදී පොරොන්දු නමැති අච්චාරුවක් මතින් ය. එම පක්ෂයට සමාජවාදය සමග කිසිදු සම්බන්ධයක් නොවූ අතර ජාතික ආර්ථික පරිපාලනයක ක්‍රියාමාර්ගයක් මත පදනම්විය. එහි සිටින සමාජ ප්‍රතිසංස්කරන හා සිංහල ස්වෝත්තමවාදයේ අරමුනු වූයේ පෙරලිකාරී කම්කරු පන්තිය කැටිකරගැනීම හා බෙදීම යි.

කෙසේ වුවද, පසු ගිය දශක තුනක කාලයක් තිස්සේ නිෂ්පාදනයේ භූගෝලීයකරනය අනෙකුත් රටවලදී මෙන් ම, ජාතිකව පරිපාලිත ආර්ථිකයක් සඳහා වූ පදනම මුලුමනින් ම අහෝසි කර ඇත. වෙලඳපොල ප්‍රතිසංස්කරන ක්‍රියාවට නැගීමේ දී ශ්‍රීලනිපය කොතාක් දුරට එජාපය අනුගමනය කර තිබේ ද යත් ඔවුන්ගේ ක්‍රියාමාර්ගයන් වෙන්කොට හඳුනාගත නොහැකි තැනකට ම පැමින තිබේ. වැඩ කරන ජනතාවගේ සමාජ තත්වයට නොකඩවා එල්ල කෙරෙන ප්‍රහාරය පුලුල්ව පැතිර ගිය කෝපයක් හා විරුද්ධත්වයක් ජනනය කර තිබේ.

එජාපය හෝ ශ්‍රීලනිපය විසින් මෙහෙයවනු ලැබූවන් නැගීඑන විරුද්ධත්වය කෙරෙහි ආන්ඩුවේ ප්‍රතිචාරය වනු ඇත්තේ කම්කරුවන් ව්‍යාකූල කිරීම හා බෙදීම සඳහා දෙමල විරෝධය කලඹාලීම යි. වාර්ගික දේශපාලනය මත පදනම් වීම තුලින් පලමුව, සිවිල් යුද්ධය ජනිත කල අතර ඉන් පසුව එය යලි පන ගැන්වීමට තුඩුදෙනු ඇත. යුද්ධයේ ද, ආර්ථික අර්බුදයේ ද, මුලු බර වැඩ කරන ජනතාවගේ කර මත පැටවීම හැරෙන්නට, මෙල්ල කල නොහැකි මෙම කිසිදු ගැටලුවකට විසඳුම්, එජාපය හෝ ශ්‍රීලනිපය සතුව ඇත්තේ නැත.

© www.wsws.org